## 1.31 ජන යාතුකර්මයෙහි 'සාර්ව ඉන්ද්‍රිය ආධිපත්‍යය'

ඉන්දික ෆර්ඩිනැන්ඩු
නාට්‍ය, මුද්‍රානාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය, කොළඹ 07.

## ABSTRACT

නාට්‍යය යනු (සජීවී) 'ශ්‍රව්‍ය දෘශ්‍ය' මාධ්‍යයක්ය යන්න මහා සම්ප්‍රදායේ ප්‍රවාදයකි. මෙහි ප්‍රකාශිතය වන්නේ නාට්‍යයෙහි අර්ථ භාව සන්නිවේදනයට අදාළ වන්නේ ප්‍රේක්ෂකයාගේ ඇස සහ කන 'පමණක්' බවයි. නාට්‍ය පිළිබඳ පෙර'පර දෙදිග මහා ආඛ්‍යාන **(Great Narratives)** සඳහා ප්‍රමුඛ වශයෙන් බල පෑ ග්‍රීක සහ සංස්කෘත නාට්‍ය කලාවන්හි භාවිතයන්ට, තත් සමාජ, සාංස්කෘතික, දේශපාලනික සහ දෘෂ්ටිවාදාත්මක හේතූන් කරණ කොට, එකී ප්‍රේක්ෂකයාගේ ඇසින් සහ කනින් සෑහීමකට පත්වන්නට සිදුවිය; නොහොත් එකී භාවිතයන්ට එම ඉන්ද්‍රිය ද්වය පමණක් ප්‍රමාණවත් විය.

මෙසේ තත් නාට්‍ය කලාවන්හි ව්‍යවහාරික තත්වයන් හෝ අරමුණු හා අවශ්‍යතා හෝ විසින්, එකී නාට්‍ය සම්ප්‍රදා ඇසුරින් න්‍යායයන් ගොඩ නැංවූ න්‍යායධර
යන්ගේ න්‍යායීකරණයන් **(Theorisations)** තීරණය කරන ලද හා සීමා කරන ලද බව පෙනේ. මූලික වශයෙන් ග්‍රීසියේ ඇරිස්ටෝටල් සහ භාරතයේ භරත වැන්නවුන්ගේ න්‍යායික ගොඩනැංවීම් පසුකාලීනව විශ්ව නාට්‍ය කලාවේ නිර්ණායක නිර්මාණය වීම් සඳහා බල පෑ හෙයින් ලෝක සම්භාව්‍ය හෙවත් විදග්ධ නාට්‍ය කලාවේ පොදු ස්වරූපය ග්‍රීක හා සංස්කෘත පොදු ස්වරූපයන්හි දිගුවක් වී ඇති බව පෙනේ.

මෙසේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් ලෙසට මහා සම්ප්‍රදායේ නාට්‍ය කලාව ලඝු වුව ද පසුකාලීනව පර්යේෂණාභිලාෂී නාට්‍යකරුවෝ එය ඉන් ඔබ්බට ගෙනයන්නට තැත් කළහ. එහෙත් එකී පර්යේෂණාත්මක ප්‍රයත්න පවා, ප්‍රධාන ධාරණාවේ මූලික ස්වරූපය ශ්‍රව්‍ය දෘශ්‍ය සීමාවෙන් ඔබ්බට ඔසවා තැබීමට සමත් නොවීය.

එහෙත් සිංහල ජන යාතුකර්මයෙහි රංග කලාත්මක අඟය විමර්ශනය කරන විට පෙනී යන්නේ එහි ප්‍රකාශන විභවතා විදග්ධ සම්ප්‍රදායට වඩා ප්‍රශස්ත සහ අසීමාන්තික බවයි. (සිංහල ජන යාතුකර්මයෙහි පමණක් නොව ලෝකයේ බොහෝ සංස්කෘතීන්හි ජන යාතුකර්ම මෙකී විභවතාවන්ගෙන් යුක්තය. මෙම අධ්‍යයනය සිංහල ජන යාතුකර්මය ස්වකීය නියැදිය කොට ගනී)

බෲස් කප්ෆරර් අදහස් කළ පරිද්දෙන්, සිංහල ජන යාතුකර්මය 'තනි, ඒකීභූත' ප්‍රසංගයක් සේ සංස්ලේෂණාත්මක විමර්ශනයට භාජනය කළ විට, එය කේවල පුද්ගලයා හා සමූහය මත 'නොවරදින' බලපෑමක් එල්ල කිරීමට හා 'අනිවාර්ය' ප්‍රතිඵල ලබාදීමට බලපාන හේතූන් අතර ප්‍රමුඛස්ථානයක් ගන්නේ එමඟින් පතුරුවා හරින **'සාර්ව ඉන්ද්‍රිය ආධිපත්‍යය'** බව පෙනී යයි. එනම් යාතුකර්ම ප්‍රසංග කාර්යයේ විපර්යාසක හැකියාව රඳා පවතින ප්‍රධාන කරුණක් වන්නේ එය, ඇස, කන, නාසය, දිව, ශරීරය යන පුද්ගලයාගේ පංචේන්ද්‍රිය මත ම ආධිපත්‍යය පතුරුවමින් ඒ සැමෙ'කකටම ප්‍රබල. සංගත හා ඓන්ද්‍රිය සංඥාවන් සම්ප්‍රේෂණය කිරීම බවයි.

මෙම පංචේන්ද්‍රිය ග්‍රාහ්‍ය සංඥාවන්ගේ විශේෂත්වය වන්නේ ඒවා, මහා සම්ප්‍රදායේ ප්‍රේක්ෂකයා විසින් කළ යුතු පරිද්දෙන්, සැලකිල්ලෙන්, අවධානයෙන්, වෑයමකින් යුතුව ග්‍රහණය කළ යුතු හා පාඨනය කළ යුතු දේ නොවනවා පමණක් නොව, ප්‍රේක්ෂකයාට නොසලකා හැරිය නොහැකි, පුද්ගලයාගේ පංචේන්ද්‍රියට 'බලහත්කාර' බලපෑම් හා එලඹුම් සිදුකරන සංඥාවන් වීමයි. යාතුකර්මය, විදග්ධ සම්ප්‍රදායානුගත නාට්‍යයන් මෙන් භාවානුභූතිමය නොව ඉන්ද්‍රියානුභූතිමය **(Sensational)** වන්නේත්, එහි පංචේන්ද්‍රිය සන්නිවේදන කාර්යය **සාර්ව ඉන්ද්‍රිය ආධිපත්‍යයක්** වන්නේත් ඒ අනුවය.

මෙකී මඟහැරිය නොහැකි **ඉන්ද්‍රියානුභූතික** ආධිපත්‍යය යනු යාතුකර්මයේ මුල සිට අග දක්වා එක එල්ලේ පංචේන්ද්‍රිය ම බැඳ තබාගැනීමක් නොවන බව වටහාගැනීම වැදගත්ය. පුද්ගලයාගේ ශාරීරිකත්වය සහ මානසිකත්වය යාතුකර්මයේ මුල සිට අග දක්වා ම ඊට අවශ්‍ය පරිසරයක හා වාතාවරණයක තන්මයීභූත කොට වෙනත් ප්‍රතිවිරුද්ධ, අසංගත සංජානන හා සංවේදන වෙත පුද්ගලයා සංවෘත කොට, යාතුකර්මයෙහි සංයුක්ත සන්නිවේදන ක්‍රියාවලියට පුද්ගලයා අනිවාර්යයෙන් හසු කර ගැනීමේ ඉන්ද්‍රිය ක්‍රියාවලියකි, එය.

බැහැර සිට බලන විට කිසිදු බලහත්කාර රඳවා තබා ගැනීමක්, විදග්ධ සම්ප්‍රදායේ ප්‍රේක්ෂකයන්ගෙන් අපේක්ෂා කරන ආකාරයේ, මුල සිට අග දක්වා එක අසුනකට බර දෙමින්, අඛණ්ඩ සාවධානයක් යොමු කළ යුතු ආකාරයේ ශික්ෂණයක් ජන යාතුකර්ම ප්‍රේක්ෂකයාගෙන් අපේක්ෂා නොකෙරේ. එහෙත් එකී නිර්බාධ, නිදහස්කාමී ප්‍රේක්ෂකත්වය විසින් හෙළිදරව් නොකරනු ලබන බරපතල කායික හා මානසික අධිකාරිත්වයක් පෙර කී **සාර්ව ඉන්ද්‍රිය ආධිපත්‍යය** තුළ ගැබ්ව ඇත.